**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2017**

**------------------------------------------------**

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 44 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනතේ 15(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2**

--------------------------------------------

ප්‍රමිතයේ 21 හා 22 වගන්ති අනුව මෙහෙයුම් ලාභයට බලපෑමක් ඇති නොවූ එකතුව රු.462,169 ක් වූ පෙර වර්ෂ ගැලපීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් ලෙස දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

--------------------------------------------

ප්‍රමිතයේ 65 වගන්තිය අනුව ජංගම නොවන වත්කම් සඳහා එලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.306,441 ක් වූ කාර්යාල උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9**

--------------------------------------------

ප්‍රමිතයේ 47 (අ) වගන්තිය අනුව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කළයුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති රු.404,288 ක් වන ග්‍රන්ථ සහ සඟරා තොගයට අදාළව ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ සිට පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණද, වර්ෂයට අදාළ වෙන්කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 15 ඡේදය පරිදි ප්‍රමිත නිර්මාණය කරන ආයතනවල මෑත කාලීන ප්‍රකාශ කිරීම් අනුව අනාගත සේවක වැටුප් වැඩිවීම්, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණන උපකල්පන පදනම් කරගෙන ප්‍රතිපත්තියක් සකස් කරගත යුතු වුවත් එවැනි ප්‍රතිපත්තියක් සකස්කර ගැනීමකින් තොරව සේවකයින් අවසානයේ ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන සේවකයින් පස්දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ලෙස එකතුව රු.632,000 ක් වෙන් කිරීම් සිදුකර තිබුණි.

**2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 264 (1) | සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත් මානව හිමිකම් කලා උළෙලට සහභාගිවීමට පැමිණි තිදෙනෙකුට නවාතැන් පහසුකම් ලබාදීම වෙනුවෙන් ගෙවා තිබුණු රු.58,000 ක කාමර කුලී සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 381 (1) | රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනය වෙනුවෙන් රාජ්‍ය බැංකුවක ආරම්භ කර තිබුණු ජංගම ගිණුම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 384 (2) | සෑම චෙක්පතක්ම රේඛනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ කලා මණ්ඩලයේ ජංගම ගිණුම හරහා සිදුකල රු.1,911,498 ක ගෙවීම් සඳහා රේඛනය නොකරන ලද චෙක්පත් භාවිතා කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලය රු.552,126 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.79,604 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.631,730 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන ලැබීම් රු.1,435,000 ක් වැඩිවී තිබුණ ද, පරිපාලන හා ආයතන වියදම් රු.203,370 ක් වැඩිවීම, වැටුප්, හා වේතන හා සේවක ප්‍රතිලාභ රු.276,314 කින් වැඩිවීම සහ වැඩමුළු, වැඩසටහන් වියදම් හා අනුග්‍රාහකත්ව දැක්වීම් රු.1,624,384 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2015 සහ 2016 වර්ෂ වලදී මූල්‍ය අතිරික්තයක් පැවති නමුත් 2013, 2014 සහ සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැළපීමෙන් පසු 2013 වර්ෂයේ රු.292,428 ක් වූ දායකත්වය 2016 වර්ෂයේ දී රු.2,021,305 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
-----------------

4.1.1 සැලසුම් කිරීම
----------------

මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීම සඳහා වාර්ෂික ඉලක්කයන්ද එම ඉලක්කයන් සඳහා වගකිවයුතු නිලධාරීන්ද සඳහන් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වුවද මණ්ඩලය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම ඒ අනුව පිළියෙල කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය
--------------------------------------

ආයතනයේ අරමුණු වෙත ළඟාවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ප්‍රතිපාදන මුදල් නොලැබීම හේතුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකළ යුතුව තිබූ වැඩ සටහන් 37කින් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 153.26 ක් වූ වැඩසටහන් 23 ක් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත්ව තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කලා මණ්ඩලයේ කොළඹ පිහිටි කාර්යාලය 2016 මාර්තු මාසයේ සිට සෙත්සිරිපාය කාර්යාලයකට මාරුකර තිබුණු අතර පැරණි කාර්යාල දූරකථනයේ බිල්පත්‍ර ලැබිය යුතු නව ලිපිනය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත දැනුම් දීම හෝ දූරකථනය විසන්ධි කරගැනීමට කටයුතු කර නොගැනීම හේතුවෙන් එකතු වූ බිල්පත් සඳහා 2017 ජනවාරි 23 දිනට රු.11,081 ක් ගෙවා තිබුණි.

(ආ) 2016 නොවැම්බර් 22 දින මිලදීගෙන තිබුණු රු.38,000 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රය දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණු නමුත් ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුළත් කර නොතිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා කලා මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 06 ක් හා තථ්‍ය සංඛ්‍යාව 09ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට අතිරික්ත සේවක සංඛ්‍යාව 03 ක් විය.

(ආ) ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අගෝස්තු 26 දිනැති අංක DMS/E3/53/4/311/1 දරන ලිපිය මඟින් අනුමැතිය ලබා දී තිබුණ ද ප්‍රධාන විධායක නිලධාරී (මණ්ඩලයේ ලේකම්) තනතුර සඳහා ස්ථිර පත් කිරීම සමාලෝචිත වර්ෂය අවසානය තෙක් සිදුකර නොතිබූ අතර ඒ සඳහා 2014

ජනවාරි 06 දින සිට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංස්කෘතික නිලධාරියකු වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි.

(ඇ) ද්විතියික මට්ටමේ කළමනාකරණ සහකාර තනතුර සඳහා නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.360,000 ක දීමනාවක් එම නිලධාරියාට ගෙවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

---------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා කලා මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**6.1 අභ්‍යන්තර විගණනය**

-----------------------

මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධානයන් අනුව මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශය විසින්ද අභ්‍යන්තර විගණනයක් සිදුකළ බවට තොරතුරු නොවීය.

**6.2 විගණන කමිටු**

----------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සෑම කාර්තුවකටම වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද කලා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.

**6.3 අයවැය ලේඛනමය පාලනය**

-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ අයවැය ගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වැඩසටහන් 13 කට අදාළව අවස්ථා 11කදී සියයට 20 කට වැඩි විචලනයක් පැවති බව නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳ මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර තැන්පතු පොලිය නිවැරදිව ගිණුම් ගත නොකිරීම<br>(ii) සේවක පාරිතෝෂික ආයෝජනය සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නොවීම.<br>(iii) ජර්නල් වවුචර පිළියෙල කිරීමකින් තොරව සටහන් 119 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ගලපා තිබීම. |
| (ආ) වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම. |